**ජාතික පර්යේෂණ සභාව - 2018**

------------------------------------------

## 1.1 මතය

ජාතික පර්යේෂණ සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික පර්යේෂණ සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයට අදාල එකතුව රු.91,382 ක් වූ පුනරාවර්තන වියදම් දෙකක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම කලින් ගෙවීමට අදාල ගිණුම්ගත කිරීම් නිවැරදි කර ගැනීමට කටයුතු කරන අතර එය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු බව |
| (ආ) | අභ්‍යන්තර විගණන ගාස්තු ලෙස 2017 වර්ෂයේ තුන්වන හා හතරවන කාර්තු සඳහා ගෙවන ලද රු. 231,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි නඩත්තු කිරීමේ වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. 2017 වර්ෂයේ වියදම් සමුච්චිත අතිරික්තයට ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2017 වර්ෂයට අදාල උපචිත ගෙවීමට අදාල ගිණුම්ගත කිරීම් නිවැරදි කර ගැනීමට කටයුතු කරන අතර එය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂය තුළ සේවය ස්ථිර කළ ආයතනයේ සේවකයින් තිදෙනෙකුගේ සේවය බණ්ඩනය වීමක් ලෙස සලකා ඔවුන් සඳහා රු.447,819 ක පාරිතෝෂික ගෙවීමක් කර තිබුණි. මෙම ගෙවීම සඳහා ප්‍රමාණවත් පාරිතෝෂික වෙන්කිරීමක් පෙර වර්ෂවල සිදුකර නොතිබුණි. | ජාතික පර්යේෂණ සභාව විසින් පාරිතෝෂික ගෙවීම සඳහා පෙර වර්ෂයන් හිදී වෙන් කිරීම් කර ඇත්තේ මූලික වැටුප පදනම් කරගෙන වේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව පාරිතෝෂික ගෙවීම සඳහා මූලික වැටුපට අමතරව දීමනාද පදනම් කර ගැනීමට 2018 මැයි 18 වන දින පැවති 80 වැනි සභා රැස්වීමේදී අනුමැතිය ලැබී ඇත. මේ අනුව පාරිතෝෂික ගෙවීමට මූලික වැටුපට අමතරව දීමනාද අදාල කර ගැනීම හේතුවෙන් පාරිතෝෂික ගෙවීමට වෙන් කිරීම ප්‍රමාණවත් නොවුණි. | නීතිරීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතු බව |
| (ඈ) | 2016 ජනාධිපති සම්මාන උත්සවයේ (President's Awards for Scientific Publication) පුවත්පත් මගින් සම්මාන හිමියන්ගේ නම් පල කිරීම සඳහා වූ වියදම වන රු. 310,063 ක මුදල ජනාධිපති සම්මාන උත්සවයේ (PASP) වියදමක් ලෙස වාර්තා නොකර එය ආයතනයේ ප්‍රචාරණ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2018 වර්ෂයේදී ජනාධිපති සම්මාන උත්සවය සඳහා මහාභාණ්ඩාගාරයෙන් ලද මුදල රු. මි. 04 කි. නමුත් මෙම උත්සවය සඳහා වියදම රු. මි. 04 ඉක්ම විය. ජාතික පර්යේෂණ සභාව මගින් සිදු කරනු ලබන වැඩසටහන් වලට අදාලව සිදු කරන මුද්‍රණ හා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දරනු ලබන වියදම් වෙනුවෙන් මෙම වැය ශීර්ෂය වෙන් කරන බැවින් ජනාධිපති සම්මාන උත්සවයේ ප්‍රචාරණය සඳහා වැයවූ වියදම මුද්‍රණ හා ප්‍රචාරණ වියදම් ලෙස ගිණුම්ගත වී ඇත. | නියමිත අයවැය සීමාව තුළ වියදම් දැරිය යුතු බව |
| (ඉ) | ජනාධිපති සම්මාන උත්සවය සඳහා වර්ෂය තුළ අනුග්‍රාහිකයින්ගෙන් ලද රු. 900,000 ක මුදල ඍජුවම අනෙකුත් ලැබීම් යටතේ වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. මූල්‍ය ප්‍රකාශ තුල මෙම උත්සව සඳහා දරන සම්පූර්ණ වියදම් එම වර්ෂයේ ආදායම ලෙස වාර්තා කරන බැවින් මෙම රු. 900,000ක මුදල ආදායම ලෙස දෙවරක් ගිණුම්ගත වී තිබුණි. | ජනාධිපති සම්මාන උත්සවය සඳහා දරනු ලැබූ මුළු වියදම රු. 4,852,970.35 වේ. මින් රු. 852,970.35 ක මුදල වර්ෂයේ ආදායම ලෙස දෙවරක් ගිණුම්ගත වීම නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | සියලු ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු බව |
| (ඊ) | 2018 ගිණුම් කාල පරිච්ඡේදය තුල Outreach ව්‍යාපෘතිය සඳහා ගෙවනු ලැබූ ගමන් වියදම් දෙකක් එම ව්‍යාපෘති වියදමක් ලෙස නොගෙන ආයතනයේ සාමාන්‍ය ගමන් වියදමක් ලෙස ගිණුම්පොත් වල වාර්ථා කර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාල සියලුම වියදම වර්ෂයේ ආදායම ලෙස වාර්තා කරන බැවින්, ඉහත සඳහන් කරුණ මත රු.55,044 අගය වර්ෂයේ ආදායමට ගැනීම මගහැරී ඇති බව නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු ගණුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු බව |
| (උ) | 2018 වර්ෂයේ මිලට ගෙන තිබූ එකතු වටිනාකම රු. 993,816 ක් වූ අයිතමයන් 04 ක් මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ යටතේ | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්ති අනුව මෙම අයිතමයන් ක්ෂය කිරීමේ අනුපාතය සියයට 0 ලෙස දක්වා තිබූ අතර ඉදිරි වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල | ඉඩම් හැර අනෙකුත් සියලු වත්කම් ක්ෂය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හදුනාගෙන තිබුණු අතර සාධාරණ හේතුවක් නොමැතිව මෙම වත්කම් සඳහා වන ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය සියයට 0 ලෙස දක්වා තිබුණි. | අනුමැතිය ඇතිව මෙම අයිතමයන් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කරනු ලැබේ. | |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2016 අංක 11 දරණ ජාතික පර්යේෂණ සභා පනතේ 03 (ආ) වගන්තිය | ජාතික අවශ්‍යතාවලට දායක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම පර්යේෂණ සභාවේ කාර්ය භාරයක් වුවද පර්යේෂණ ව්‍යාපෘතියක අවසන් ප්‍රතිඵලය ඇගයීමේ දී එහි සාර්ථකත්වය තීරණය කරනු ලබන නිර්ණායකය ලෙස Science Citation Index(SCI) හි ප්‍රකාශනයක් සිදු කිරීමේ හැකියාව සැලකිල්ලට ගන්නා අතර පර්යේෂණයෙහි ප්‍රතිඵලය, එහි බලපෑම හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ ප්‍රමාණාත්මක අවධානයක් යොමුකර නොතිබුණි. | Science Citation Intern හි ප්‍රකාශනයක් සිදු කිරීමේ හැකියාව යම් විද්‍යාත්මක පර්යේෂණයක ප්‍රතිපල වල වලංගුභාවය පිළිබඳව නිර්මාණයකි. ජාතික පර්යේෂණ සභාව මෙම නිර්ණායකයට සීමා නොවූවද පර්යේෂක සාර්ථකත්වය මැන බැලීමේදී විශේෂිත පර්යේෂණාත්මක ප්‍රතිපලයක් එමඟින් උත්පාදනය විද නොවීද යන්න විමසා බැලීමට ජාත්‍යන්තරව පිළිගැනෙන පදනම් රේඛාවක් යොදාගැනීම නොවැලැක්විය හැකි කරුණකි. මෙහිදී එම පදනම් රේඛාවේ කාර්යභාර්ය ඉටු කරයි . මෙම ජාතික පර්යේෂණ සභාවේ ආරම්භයේ සිටම සිදු වූවකි. ඊට හොඳම නිදසුනක් නම් අලුත උපන් බිළිඳුන් සම්බන්ධයෙන් මන්ද තයිරොඩතාවය පරීක්ෂාවට ලක් කිරීම සඳහා ලබා දුන් නිර්දේෂය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ජාතික ප්‍රතිපත්තියක් දක්වා පැමිණීමය. මෙය ජාතික පර්යේෂණ සභාව විසින් මූල්‍යනය කෙරුණු පරීක්ෂණයක ප්‍රතිඵලයක් වේ. | පර්යේෂණ ආරම්භ කිරීමට ප්‍රථම හා අවසන් වූ පසුව ද පර්යේෂණයේ ප්‍රතිඵල ජාතික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සමාජගත කිරීමේ හැකියාව පිළිබඳ සැලකිලිමත් විය යුතු බව |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,501,052 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,084,738 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,416,314 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රතිපාදන ලැබීම් රු.1,825,924 කින් වැඩි වී තිබීමද, ඇස්බැස්ටස් ව්‍යාපෘතිය සඳහා ලද රු.5,120,440 ක ප්‍රතිපාදනය උපයෝජනය නොවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ ව්‍යාපෘති කාර්යක්ෂමව හා අපේක්ෂිත කාලපරිච්ඡේදය තුළ අවසන් කිරීම තහවුරු කිරීමට උපකරණ මිලදී ගැනීම් ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක්/කාල රාමුවක් පර්යේෂකගෙන් ලබාගත යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | ජාතික පර්යේෂණ සභාවේ මාර්ගොපදේශ සංග්‍රහය අනුව පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් ප්‍රදානය කර මාස 09 ක් ඇතුලත උපකරන මිලදී ගැනීමට ප්‍රසම්පාදනය අනුමැතිය ලබා ගැනීමට ව්‍යාපෘති පර්යේෂකයින් පියවර ගත යුතුය. මේ වන විට සභාව විසින් පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය නියාමනය කරමින් ව්‍යාපෘති පර්යේෂකයින් පෙළඹ වීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව, බොහෝමයක් ව්‍යාපෘති පර්යේෂකයින් මුල මාස 09 ඇතුලත ප්‍රසම්පාදන අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන අතර, අනෙකුත් පර්යේෂකයන්ට හටගන්නා වූ නොවැලැක්විය හේතුන් මත නියමිත මාස 09 ඇතුළත ප්‍රසම්පාදන අනුමැතිය ලබා ගැනීමට නොහැකි වේ.<br>සැලසුම් සකස් කිරීම මඟින් ඇති වන්නා වූ සීමා කිරීම තුළින් පර්යේෂණ ව්‍යාපෘති අඩාල වීමට හෝ නව ව්‍යාපෘති බිහි වීමට දිරි දීමක් සිදුනොවේ. | පර්යේෂණයක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා අවශ්‍ය උපකරණ මොනවාද හා ඒවා මිලදී ගැනීම සම්බන්ධව සැලැස්මක් සකස් කළ යුතු බව |
| (ආ) | ප්‍රගති වාර්තාවලට අදාල ඇගයීම් කරුවන්ගේ අදහස් දැක්වීම් පිළිබඳ පර්යේෂකයා දැනුවත් කල ද ඒ සම්බන්ධ ප්‍රතිචාර වහාම ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ප්‍රගති වාර්තාවලට අදාල ඇගයීම කරුවන්ගේ අදහස් පිළිබඳව පර්යේෂකව දැනුවත් කරනු ලබයි. ඇතැම් පර්යේෂකයින් විසින් ඊට අදාළ ප්‍රතිචාර දක්වන අතර ඇතැම් පර්යේෂකයින්ගේ ප්‍රතිචාර ලබා ගැනීමෙහි ප්‍රමාදයක් පවතී. ඉදිරියේදි මේ සම්බන්ධව ප්‍රතිචාර වහාම ලබා ගැනීමේ ක්‍රමාවේදයක් සකස් කිරීමට නියමිතය. | පර්යේෂණය අවසන් වූ වහාම ප්‍රගති වාර්තා ලබාගෙන ඇගයීම් කටයුතු සිදුකිරීමට හා එම ඇගයීම් සම්බන්ධව පර්යේෂකයන්ගේ අදහස් ලබා ගැනීමට හැකි කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පර්යේෂක මූලික පර්යේෂණ ව්‍යාපෘතිවල (ID grants) ප්‍රගතිය ඇගයීමේ දී පර්යේෂක ලබා දෙන ප්‍රගති වාර්තා පමණක් ඇගයීම සිදු කරන අතර භෞතිකව පරීක්ෂා කර ප්‍රගතිය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි | පර්යේෂක මූලික පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීමේදී පර්යේෂක ලබාදුන් ප්‍රගති වාර්තා පමණක් ඇගයීම සිදු නොකරයි. වසරකට වරක් ජාතික පර්යේෂණ සභාවේ නිලධාරියෙකු අදාල පර්යේෂණ ආයතන වලට ගොස් ඉන්වෙන්ට්‍රි පරීක්ෂාවේ නිරත වන අතර භෞතිකව පරීක්ෂා කිරීමක් සිදු කරනු ලබයි. | පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | පිරිවැය රු. 16,024,000 ක් වූ ව්‍යාපෘති 03 ක් වාණිජකරණය කිරීම සඳහා වැඩිදියුණු කිරීමේ හැකියාවක් පවතින බව හඳුනාගෙන ඇතත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි | ජාතික පර්යේෂණ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන Investigator Driven Research Grant ව්‍යාපෘති, මූලික පර්යේෂණ වන අතර එහි ප්‍රධාන අරමුණ වනුයේ රට තුළ විද්‍යාව දියුණු කිරීම වන අතර වාණිජකරණය කිරීම එම ව්‍යාපෘති වලින් බහුල වශයෙන් සිදු නොවේ. නමුත් ව්‍යාපෘති 03 ක් වාණිජකරණය කිරීම සඳහා වැඩි දියුණු කිරීමේ හැකියාවක් පවතින බව හඳුනාගෙන ඇත. දැනට 2005 සිට 2011 දක්වා අවසන් කළ ව්‍යාපෘති 50 ක් සඳහා පසු විපරම් කිරීමක් ජාතික පර්යේෂණ සභාවේ කවුන්සිලය මගින් සිදුකරගෙන යනු ලබයි. මේ අනුව ඉහත ව්‍යාපෘති 03 සඳහා ද ඉදිරියේදී පසු විපරම් කිරීමක් සිදු කරනු ඇත. | වාණිජකරණය කළහැකි පර්යේෂණ හඳුනාගෙන ඒවා වැඩිදියුණු කිරීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු බව. |
| (ඇ) | වල්ලපට්ට ශාක විශේෂයෙහි ස්‍රාවය වාණිජකරණය කිරීම සඳහා සුදුසු ලෙස වැඩිදියුණු කිරීම සහ පැල තවාන් ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද පිරිවැය රු.11,583,792 ක් වූ පර්යේෂණ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් මාසයේදී සාර්ථක ලෙස අවසන් වී තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් පර්යේෂණ සභාව රු. 5,687,500 ක් වැයකර තිබුණි. සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීම හා අපනයනය තුළින් විශාල ආදායමක් ලබා ගැනීම අපේක්ෂා කලද 2019 මැයි විගණන දින වන විටත් | දේශීය වල්ලපට්ට ශාකයෙහි කඳෙන් ලබා ගන්නා ස්‍රාවයට විදේශයන්හි අධික ඉල්ලුමක් ඇති බව හොඳින් දන්නා කරුණකි. නමුත් අප රටේ නීති පද්ධතිය අනුව එය අපනයනය කිරීමට හැකියාවක් නොමැති අතර මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණක් වූයේද වල්ලපට්ට ශාකයෙන් ලබා ගන්නා නිෂ්පාදන හඳුන්වා දී එමඟින් අපනයන වටිනාකම ඉස්මතු කිරීමයි. එහිදී පර්යේෂණ හවුල්කරු විවිධ අමාත්‍යාංශ වල සහය පතා ඇති අතර එහිදී ඔහුට ලැබී ඇති උපදෙස වන්නේ මෙම නිස්කාරයට යම් ද්‍රාවකයක් එකතු කිරීම මඟින් එය අගය අඩුකර අපනයනයට කටයුතු කරන ලෙසයි. නමුත් විදේශීය කර්මාන්ත වලදී මෙම නිස්සාරකයට ශුද්ධ (Pure) ලෙසම ඉල්ලුම් කරන නිසා ඉහත ක්‍රමය අනුගමනය කිරීමෙන් පලක් නොවන බව පර්යේෂණ හවුල්කරුගේ අදහස වී ඇත. | පර්යේෂණයක් ඇරඹීමේදී ඒවායේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා බලපෑ හැකි සමාජ හා ආර්ථික සාධක ද සැලකිල්ලට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වල්ලපට්ට ශාකයේ කොටස් අපනයනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. එබැවින් ව්‍යාපෘතියෙහි අපේක්ෂිත අරමුණු කරා ලඟා වීමට නොහැකි වී තිබුණි | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකාර සහකරුවන් දෙදෙනෙක් බඳවා ගැනීම සඳහා රු. 102,075 ක් වියදම් කර තිබුණත් 2019 මැයි වන විටත් අදාල බඳවා ගැනීම් සිදු කර නොතිබුණි | සමාලෝචිත වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාව කළමණාකරුවන් දෙදෙනෙක් බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍ර කැඳවූ අතර ඊට අදාල මූලික පරීක්ෂා කිරීමේ කටයුතු (Screening) කවුන්සිලයේ අනුමැතිය පරිදි ජාතික පර්යේෂණ සභාවේ නිලධාරීන් විසින් සිදු කරන ලදී. ඒ සඳහා රු.102,075 ක වියදමක් දරා තිබුණි. එහෙත් බඳවාගැනීමේ තරඟ විභාග පැවැත්වීම සඳහා අධික වියදම් දැරීමට සිදුවිය හැකි බව හඳුනාගැනීම හේතුවෙන් බඳවාගැනීම් සිදුකිරීම ප්‍රමාද විය. | බඳවා ගැනීම් සම්පූර්ණ කළ යුතු බව. |
| (ඉ) | 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ජාතික පර්යේෂණ සභාව සඳහා මිලදී ගත් රු. 105,992 වූ මෝටර්රථ අමතර කොටස් හා වායුසමීකරණ අමතර උපාංග පිළිබඳ සටහන් තොග ලේඛණයෙහි සටහන් කර නොතිබුණි | මෝටර් රථය සඳහා වායුසමීකරණ අමතර උපාංගයක් සවිකල අතර, ඒ සඳහා රු. 105,992 ක මුදලක් වැය විය. එය ස්ථාවර වත්කම් ලේඛණයෙහි සටහන් කර ඇති නමුත් තොග ලේඛණයෙහි සටහන් වී නොමැති අතර එය නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | මිලදී ගැනීම් තොග ලේඛණයේ නිවැරදිව සටහන් කළ යුතු බව. |
| (ඊ) | පර්යේෂණ ප්‍රදානයකට අදාලව රු.1,775,313 කට මිලදී ගෙන තිබූ උපකරණයක් තොග ලේඛණයෙහි රු. 597,005 ක් ලෙස දක්වා තිබුණි | මෙම උපකරණයේ මුළු වටිනාකම රු. 1,775,312 ක් වූ අතර එය වවුචර 7 කින් ගෙවා තිබුණි. තොග ලේඛනයේ එක් වවුචරයක වටිනාකම පමණක් ඇතුළත් කර තිබුණි. තොග ලේඛණයෙහි මෙම උපකරණයේ වටිනාකම රු. 1,775,312 ලෙස නිවැරදි කරන ලදී. | මිලදී ගැනීම් තොග ලේඛනයේ නිවැරදිව සටහන් කළ යුතු බව. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වව්නියා දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් තුළ පානීය ජලය හා ගෘහාශ්‍රිත ජලය තුළ ෆ්ලෝරයිඩ් මට්ටම හා සාන්ද්‍රණය අඩුකිරීම තුළින් වකුගඩු ආසාදන අවම කිරීම සඳහා වන බලපෑම හඳුනාගැනීම සඳහා පර්යේෂණ සභාව පුද්ගලික සමාගමක් සමඟ එක්ව 2014 වර්ෂයේ දී පිරිවැය රු. 20,218,000 ක් වූ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. 2017 අගෝස්තු අවසන් කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා 2019 පෙබරවාරි මාසයේදී සිදුකළ අවසන් වාර්තා ඇගයීම් අනුව මෙම ව්‍යාපෘතිය විද්‍යාත්මක වශයෙන් සාර්ථක වුවත් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ව්‍යාපෘතියක් වශයෙන් අසාර්ථක බව දක්වා තිබුණි. විගණන දිනය වන විටත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පාලක සභා තීරණය ගෙන නොතිබූ අතර රු.1,860,437 ක මුදලක් අදාළ ගිණුමේ නිෂ්කාර්යව තිබුණි. | 2014 වර්ෂයේදී ජාතික පර්යේෂණ සභාව, කොළඹ විශ්ව විද්‍යාලය හා ලින්ක් නැචුරල් පුද්ගලික ආයතනය එක් වී රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන යටතේ වවුනියාවේ සෙට්ටිකුලම් ප්‍රදේශය නිදර්ශකයක් ලෙස තෝරාගෙන එහි වෙසෙන ජනතාවගේ CKDu රෝගී තත්වය මැඩපැවැත්වීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එහිදී පිරිපහදු කරන ලද ජලය මෙම ව්‍යාපෘතියට අදාල ජල පිරිපහදු යන්ත්‍රය මඟින් අඛන්ඩව සෑම පවුලකටම බෙදා හැරීමට ව්‍යාපෘති කණ්ඩායම කටයුතු කළ අතර එලෙස අවුරුදු 03 ක් පුරාවටම පිරිපහදු කරන ලද ජලය ලබා දීම මඟින් ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීමට හැකියාව ලැබුණ බව පර්යේෂණ කණ්ඩායමේ විශ්වාසයයි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය මඟින් වෛද්‍ය සායන පවත්වා පිරිපහදු කරන ලද ජලය පාවිච්චි කරන පිරිසගේ රෝගී තත්ව වල නිර්ණායක මැන බලමින් ඊට අදාල විශාල දත්ත ප්‍රමාණයක් එක්රැස් කර ගැනීමට ව්‍යාපෘති කණ්ඩායමට හැකිවිය. එනම් මෙම ව්‍යාපෘතිය මඟින් සෙට්ටිකුලම් ප්‍රදේශයේ ජනතාවගේ CKDu රෝගී තත්ව සමනය කිරීමට අදාල විශාල තොරතුරු ප්‍රමාණයක් එක්රැස් කර ගැනීමට හැකියාව ලැබී ඇත. මෙවැනි පර්යේෂණ මඟින් ලබා ගන්නා තොරතුරු විද්‍යාත්මක ප්‍රකාශන වල පල කිරීම මඟින් ඒවා CKDu රෝගී තත්වයට අදාල ඉදිරි පර්යේෂණ කටයුතු සඳහාද භාවිතා කිරීමට හැක. සෙට්ටිකුලම් ප්‍රදේශය නිදර්ශකයක් ලෙස යොදාගෙන ලබාගත් දත්ත සංකලනය කිරීමෙන් ලැබුණු නිගමන ඉදිරි පර්යේෂණ වලට යොදාගත හැකිවන පරිදි විද්‍යාත්මක ප්‍රකාශනවල පල කිරීම, CKDu රෝගී තත්වයට ස්ථිරසාර පිළියම් සෙවීමට රුකුලක් වනු ඇත. | පර්යේෂණය අවසන් බැවින් ඉතිරි මුදල් ඵලදායී කාර්යයන් සඳහා උපයෝජනය කිරීම සුදුසු බව. |
| (ආ) | ඇස්තමේන්තුව රුපියල් මිලියන 50ක් වූ Locally development sustained release tablets නම් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතිය සඳහා ජාතික පර්යේෂණ සභාවේ දායකත්වය රුපියල් මිලියන 25 ක් විය. එක් වාරයකදී | මෙම ව්‍යාපෘතිය හඳුනාගන්නා අවස්ථාවේදී තරගකාරීත්වයෙන් වන බලපෑම සලකා තිබූ අතර ඒ වන විට වෙනත් කිසිදු ලාංකික ආයතනයක් මෙවැනි බෙහෙතක් නිෂ්පාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. නමුත් මෙම පර්යේෂණය ක්‍රියාත්මක වන කාලය තුළදී විවිධ සාධක මත ප්‍රායෝගිකව මෙම බෙහෙත නිපදවීමේදී නොයෙකුත් ගැටලු මතුවීම | පර්යේෂණ භාරගැනීමට පෙර ඒ සඳහා බලපෑ හැකි සමාජීය හා ආර්ථික හා තරඟකාරී සාධක සැලකිල්ලට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාගන්නා බෙහෙත් පෙත්තක් මඟින් දවස පුරාම ක්‍රමානුකූලව ශරීරයට ඖෂධ අවශෝෂනය කරගත හැකි අකාරයට බෙහෙත් පෙත්තක් සංවර්ධනය කිරීම අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 2018 නොවැම්බර් 02 දිනැති සභා තීරණ අනුව නතර කර දැමීමට තීරණය කර තිබුණි. මෙහිදී ව්‍යාපෘතිය හදුනාගැනීමේදී හා ව්‍යාපෘති කාලය නිර්ණය කිරීමේදී ප්‍රධාන සාධකයක් වූ තරඟකාරීත්වයෙන් වන බලපෑම ගැන අවධානය යොමු කර නොතිබුණි. | නිසා බලාපොරොත්තුවූ කාල සීමාව තුලදී ඉලක්ක කරගත් සාධන මට්ටම් වලට එළඹීමට නොහැකි වී ඇත. මේ පිළිබඳ උත්ගත වූ ගැටළුව එම පෞද්ගලික ආයතනය විසින්ම ජා.ප.ස දැනුවත් කළ අතර, අවසන් ප්‍රතිඵලයට ලඟාවීමට තවත් අධික කාලයක් ගතවනු බවත්, විශාල පිරිවැයක් බවත්. එලෙසම දැනටමත් අනෙකුත් තරගකාරී සමාගම් විසින් මෙය නිෂ්පාදනය කිරීමට කටයුතු කරගෙන යන නිසාත් අධික ව්‍යාපෘතිය නවතා දැමීම වඩාත් සුදුසු බව ව්‍යාපෘති හවුල්කරුවන්ගේ මෙන්ම ජාතික පර්යේෂණ සභාවේද තීරණය විය. | |
| (ඇ) | ඉහත (ආ) හි සඳහන් පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා සභාවේ ප්‍රදානයන් යටතේ මිලදීගත් නමුත් 2019 මැයි වන විටත් නිෂ්කාර්යව පවතින රු. 2,869,904 ක් වටිනා උපකරණ ප්‍රයෝජනවත් කාර්යයකට යොදාගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය වූ අවස්ථාවේදී ව්‍යාපෘති හවුල්කරුවන්ගේ ඉල්ලීම වූයේ අනෙකුත් ඖෂධවේදී පර්යේෂණ සඳහා මෙම උපකරණ භාවිතා කල හැකි බැවින් රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමෙන් පසු එම උපකරණ පෞද්ගලික හවුල්කරුට ලබා දෙන ලෙසයි. එම ඉල්ලීම 2019.02.22 පැවති ජා.ප.ස. කමිටු රැස්වීමේදී අනුමත විය. මෙම උපකරණ මේ වනවිටත් ව්‍යාපෘතියේ පෞද්ගලික හවුල්කරුගේ විද්‍යාගාරයේ ස්ථාපිත කර ඇති අතර එම ඖෂධවේදී පර්යේෂණ සඳහා භාවිතා කරමින් පවතී. මේ වනවිට මෙම උපකරණ සඳහා රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමට ජා.ප.ස. කටයුතු කරමින් පවතින බව දැන්වීමට කැමැත්තෙමු. | පර්යේෂණ සඳහා මිලදී ගන්නා වත්කම්, ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා උපයෝජනය කළ යුතු බව. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ සභාව විසින් ප්‍රදාන දෙනු ලබන තනි පුද්ගල පර්යේෂණ ව්‍යාපෘති, අරමුණුගත බහු විෂයික පර්යේෂණ ව්‍යාපෘති සහ පෞද්ගලික රාජ්‍ය හවුල්කාරීත්ව පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළද, සමාලෝචිත වර්ෂය සඳහා සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් පර්යේෂණ ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබුණි. | 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම තුළින් එක් එක් පර්යේෂණ ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්ම මගින් මූල්‍ය හා භෞතික සැලසුම් ඉදිරිපත් කළ යුතු බව. |